# පශ්චාත් උගතුන්ගේ පශ්චාත් යුද්ධ තත්වය

මෙරට පශ්චාත් උගත්තු වචනයේ පරිසමාප්තාර්ථයෙන් කෙසේ වෙතත් පසු උගත්තු වෙති. ඔවුන්ගෙන් ඇතැම්හු විශ්වවිද්‍යාලයීය කථිකාචාර්යවරු වෙති. තවත් ඇතැම්හු දේශපාලනඥයන්ට පින්සිඳුවන්නට ජනමාධ්‍යවලට පැනගත්තෝ වෙති. තවත් සමහරු රාජ්‍ය නොවන ආයතනවල කුලියට වැඩකරන්නෝ වෙති. කවුරුන් වුවත් ඔවුන්ට කළ හැක්කේ බටහිරයන් කියා ඇති දේ නැවත නැවතත් පුනරුච්චාරණය කිරීම පමණකි.

ඔවුහු තමන් හෝ තම මිතුරකු හෝ කියවා ඇති ඉංගිරිසි පොතක තිබූ සංකල්පයක් සිංහල පමණක් දන්නා පාඨකයනට කියා දෙති. ඔවුන් කියන ආකාරයට ඔවුන් කරන්නේ ඉංගිරිසි සංකල්ප හා ප්‍රවාද සිංහල පාඨකයනට හඳුන්වාදීමකි. මේ හඳුන්වාදීම යන්න ම පරස්පරයකි. තමන්ට වෙනත් අයකු ආර්ථිකයෙන් පැරදිවිය නො හැකි නම් සංකල්පීයව හෝ දෙවැන්නා පැරදවීය හැකි ක්‍රමයක් ඇත්නම් පශ්චාත් උගත්තු ඒ ක්‍රමය සොයා යෑමට උනන්දු වෙති.

පශ්චාත් උගත්තු පශ්චාත්නූතනවාදය පශ්චාත් මාක්ස්වාදය ආදී දේ ගැන තොරතෝංචියක් නැතිව කතාකරති. එහෙත් ඔවුන්ගෙන් කී දෙනකු ලියෝතාර්ද් ගේ පශ්චාත්නූතනවාදී තත්වය නමැති පොත කියවා ඇත් දැයි නො දනිමු. ඒ පොතට අනුව වුවත් පශ්චාත් නූතනත්වයන් මෙරට තබා බටහිර රටවලවත් නොමැති බව පහසුවෙන් පෙන්වාදිය හැකි නමුත් ඊනියා පශ්චාත්නූතනත්වයක් ගැන ලියන්නන්ට හා කියන්නන්ට ඒ ගැන වගවිභාගයක් නැත. ලෝකය තවමත් බටහිර ක්‍රිස්තියානි නූතනත්වය අත්හැර නැති නමුත් මෙරට තබා බටහිර ජීවත්වන ඊනියා පශ්චාත්නූතනවාදී පඬියන්ට ද ඒ නො තේරෙයි. අවුරුද්දකට වතාවක් මෙරටට පැමිණ මොණර රැඟුම් රඟ දක්වා යන බටහිර ජීවත්වන පඬියකු පශ්චාත්නූතනත්වයක් ගැන කිසිවක් නොදන්නා ඒ ගැන කතාකිරීම පවා කාලය කා දැමීමක් ලෙස සලකන ජාතිකත්වයක් ගැන කතාකරන සාහිත්‍යකරුවකුගේ කෘති ඊනියා පශ්චාත්නූතනවාදී අදහස් ඔස්සේ ව්‍යාජ ඇගයීමකට ලක්කිරීම සාහිත්‍යකරුවාට කරන අවමානයක් ලෙස නොදකින්නේ ඒ විචාර ඔස්සේ තම ව්‍යාජ පාණ්ඩිත්වය ගැන තමන්ටම සහතික ලියාගැනීමට අවස්ථාව ලැබෙන බැවිනි. සාහිත්‍යකරුවා ද තමන්ට හරිහැටි නොතේරෙන මේ ව්‍යාජ විචාර ගැන කිසිවක් නොකීමට ප්‍රවේසම් වීම පශ්චාත්නූතනත්වයේ කෙසේ වෙතත් අබුද්දස්ස යුගයේ ලක්ෂණයකි.

එහෙත් මෙහි දී අප සාකච්ඡාකිරීමට බලාපොරොත්තුවන්නේ මේ පුස්සන්ගේ සාහිත්‍ය විචාරය නො වේ. පශ්චාත්නූතනත්වයක් ගැන කතා නොකරන පශ්චාත් උගත්තු ද වෙති. එහෙත් ඔවුහු ද පශ්චාත් යන වචනයට ඇල්මක් දක්වති. ඒ ඔවුන්ද කාගේ කාගේ හෝ පසුපස යන නිසා යැයි සිතිය හැකි ය. මේ පශ්චාත් උගත්තු විවිධ බටහිර උගතුන් පසුපස යන්නෝ වෙති. ඒ බොහෝ දෙනෙක් බටහිර මුදල් පසුපස ද යති. අද මෙරට පඬියන් අතර නිතර සාකච්ඡාවට බඳුන්වන මාතෘකාවක් වනුයේ ඊනියා පශ්චාත් යුද්ධ තත්වයයි. ඇතැම්හු පශ්චාත් යුද්ධ දෙමළ ජාතිකවාදය ගැන පශ්චාත්තාප වෙති. තවත් සමහරුන්ට ප්‍රශ්නයක් වී ඇත්තේ පශ්චාත් ප්‍රභාකරන් ලංකාව ය. ප්‍රභාකරන්ගෙන් පසුව ලංකාවක් කුමට දැයි ඔවුන් සිතනවා විය හැකි ය. තමන් මින් පසු දෙමළ ජනයාගේ මානව අයිතිවාසිකම් වෙනුවෙන් කඳුළු සලන්නේ කෙසේ ද, ඒ කඳුළු සමග වැගිරෙන ඩොලර්වලට කුමක් සිදුවේ ද ආදී දහසක් ප්‍රශ්න මේ පඬියන්ට ඇති බව පැහැදිලි ය.

ඊනියා පශ්චාත් යුද්ධ තත්වයක් ඇතිවන්නට මෙරට යුද්ධයක් තිබිය යුතු ය. එහෙත් මෙරට යුද්ධයක් නැත. පශ්චාත් උගතුන්ට ඒ ගැන මෙලෝ හසරක අවබෝධයක් නැත. ඔවුන් සිතන්නේ ඊනියා යුද්ධය හේතුකොටගෙන සුද්දන්ගේ ඊනියා ගැටුම් නිරාකරණ, සම්මන්ත්‍රණ, වැඩමුළු, ශිෂ්‍යත්ව, උපාධි ආදිය ඔස්සේ තමන්ට ගතමනාවක් ලැබෙන බව ය. එහෙත් අද යුද්ධයක් තිබේ නම් එකල ජ වි පෙරමුණ සමග ද යුද්ධයක් තිබී ඇතැයි පිළිගැනීමට සිදුවෙයි. එහෙත් අසූවේ දශකයේ අග යුද්ධයක් ගැන කතාකළ පශ්චාත් උගත්තු නො වූහ. ඔවුන්ට එදා මානව හිමිකම් ප්‍රශ්න ද නො තිබිණි.

මෙරට පසුගිය තිස්වසරක පමණ කාලයක් තිස්සේ තිබුණේ ත්‍රස්තවාදයක් හා එය පරාජය කිරීමට යැයි කියමින් කෙරුණු රඟපෑම් ය. රඟපෑමෙහි යෙදුණවුන් ත්‍රස්තවාදයක් තිබූ බව පිළිගත්තේ යැයි මෙයින් ගම්‍ය නො වෙයි. ඔවුන්ට එය දෙමළ ජාතිකත්ව සටනක් විමුක්ති අරගලයක් හෝ වෙනත් එවැන්නක් හෝ වූ බව පැහැදිලි ය. චන්ද්‍රිකා

© Prof. Nalin De Silva

කුමාරතුංග නෝනා මේ ඊනියා විමුක්තිකාමීන් මුණගැසීමට තම සිංහල බෞද්ධ විරෝධී සැමියා සමග එකල මද්‍රාසියට ද ගිය බව අපට මතක ය.

දෙමළ ත්‍රස්තවාදය පරාජයකිරීම සඳහා බටහිරයන්ගෙන් මිදී, සිදුවිය යුතු පරිදි මෙහෙයුම් අරඹා තවමත් ගතවී ඇත්තේ අවුරුදු දෙකහමාරක් පමණකි. බටහිරයන්ගේ හා ඉන්දියානුවන්ගේ අවශ්‍යතා අනුව ක්‍රියා නොකරන්නට ත්‍රස්තවාදය පරාජය කිරීමට අවුරුදු තිහක් බලා සිටින්නට සිදු නොවනු ඇත. කෙසේ වෙතත් මේ හමුදා මෙහෙයුම් රාජ්‍යයට එරෙහිව අවිගත් (බටහිරයන් ලබා දුන් අවිගත්) ත්‍රස්තවාදීන් හා ඔවුන් පෙනී සිටි සියල්ල පරාජය කිරීම සඳහා කෙරුණේ වෙයි. කිනම් හේතුවක් නිසා වුව ද මෙහෙයුම් අවුරුදු තිහක් දිගගැස්සීම නිසා එ යුද්ධයක් බවට පරිවර්තනය නො වෙයි. මෙහෙයුම් අවුරුද්දක් කෙරුණ ද අවුරුදු පනහක් කෙරුණ ද සංකල්පීය ව ගත්කල එ හමුදා මෙහෙයුම් මිස යුද්ධයක් නො වෙයි.

දෙමළ ත්‍රස්තවාදය පරාජය කිරීමත් සමග දෙමළ ත්‍රස්තවාදීන් යමක් වෙනුවෙන් පෙනී සිටියේ ද එ සියල්ල ද පරාජය වෙයි. අසූවේ අග ජ වි පෙ ත්‍රස්තවාදී ක්‍රියාවල නිරතවූයේ ඊනියා සමාජවාදයක නාමයෙනි. ත්‍රස්තවාදය පරාජය කිරීමෙන් පසු පශ්චාත් යුද්ධ තත්වයක් ගැන කතාකළ අයෙක් නො වූහ. ඊනියා තරුන අසහන කමිටුවක් නම් ජනාධිපති ප්‍රේමදාස මහතා විසින් පත්කෙරිණි. එ කමිටුවේ සාමාජිකයන්වත් කමිටු වාර්තාවට කුමක් සිදුවිණි දැයි නොදන්නේ යයි සිතමු. ත්‍රස්තවාදය පරාජය කිරීමෙන් පසුව ජ විපෙ සමග හෝ වෙනත් මාක්ස්වාදී යැයි කියාගන්නා කණ්ඩායමක් සමග හෝ රාජ්‍ය බලය බෙදාගැනීමට සාකච්ඡා කළ බවක් පශ්චාත් උගතුන්ට මතක තිබිය නොහැක්කේ එවැන්නක් නොවූ බැවිනි.

දෙමළ ත්‍රස්තවාදය බිහිවූයේ දෙමළ බෙදුම්වාදය හේතුකොටගෙන ය. එහි ද පසුපස ඇත්තේ දෙමළ ජාතිවාදය ය. දෙමළ ත්‍රස්තවාදීන් පෙනී සිටියේ උතුරු හා නැගෙනහිර පළාත් ඇතුළු භූමියක ඊළමක් පිහිටීමට වුවත් බටහිරයන් ඔවුන්ට අවි දී ඇත්තේ මුළු රටම ඊළමක් කිරීමට බව අදවන විට පැහැදිලි ය. දෙමළ ත්‍රස්තවාදයේ පරාජයත් සමග බටහිරයෝ ඔවුන්ගේ අරමුණ ඉටුකර ගැනීම සඳහා වෙනත් මං සොයති, අද ඔවුහු ලජ්ජා නැතිව කොටි පරාජයකිරීම පිළිබඳ ව තම සතුට පළකරති. එ කපන්න බැරි අත සිඹීමක් නොවේ. අත සිඹ පසුව එ කපාදැමීමේ අරමුණින් කරන මගෝඩියකි. දෙමළ ත්‍රස්තවාදයේ පරාජයත් සමග ඊනියා සන්ධීය රාජ්‍යය ද බලය බෙදීම (බලය විමධ්‍යගතකිරීම) ද පරාජය වෙයි. අද කොටින්ගෙන් බේරී පළා එන අහිංසක දෙමළ ජනයාට බලය බෙදීමක් අවශ්‍ය නැත. විනයාගමූර්ති මුරලිදරන් හෙවත් කරුණා අම්මාන් ඇමතිවරයාට ද බලය බෙදීමක් අවශ්‍ය නො වෙයි. එ අවශ්‍ය වන්නේ සිංහල බෞද්ධ විරෝධී බටහිරයන්ට, මෙරට කසිකබල් මාක්ස්වාදීන්ට, ඇතැම් පූජකයන්ට හා තවත් කිහිප දෙනකුට ය.

දෙමළ ත්‍රස්තවාදය පරාජයත් සමග ඊනියා සර්වපාක්ෂික කමිටුවේ කාර්යභාරය ද අවසන් වෙයි. එ කමිටුව පිහිටුවීමේ මූඛ්‍ය අරමුණ වූයේ දෙමළ ත්‍රස්තවාදය ඉල්ලූ වෙන ම රාජ්‍යයක් වෙනුවට විකල්පයක් යෝජනා කිරීම ය. එ පිහිටුවූයේ ත්‍රස්තවාදය පරාජය කිරීමට නොහැකිය යන උපකල්පනය යටතේ දෙමළ ජනයා කොටින්ගෙන් ගලවාගැනීමේ (මුදාගැනීමේ, දිනාගැනීමේ) උපායක් ද ලෙස ය. එ උපකල්පන අද වලංගු නො වේ. දෙමළ ජනයා කොටින්ගෙන් ගැලවී අවුත් හමුදා ආරක්ෂාව යටතේ පසුවෙති. ඔවුන්ට අවශ්‍ය වන්නේ ඊනියා බලය බෙදීමක් නොව යම් ආකාරයක සංවර්ධනයකි. නැගෙනහිර පළාතේ දැනටමත් එ සිදු වෙමින් පවතී. උතුරේ ද එ යථාකාලයේ දී සිදුවනු ඇත. වෙනම රාජ්‍යයක් යන්න පැරදී ඇති විට වෙන ම රාජ්‍යයකට ඊනියා විකල්ප අවශ්‍ය නො වේ. අනෙක් අතට විසඳිය යුතු ප්‍රශ්නය කුමක් ද යන්න ද තවමත් පැහැදිලි කර නැත. මම ද කලක් ඊනියා සර්ව පාක්ෂික කමිටුවේ කටයුතුවලට සහභාගි වීමි. එසේ කෙළේ එකම එක අරමුණකින් ය. එ හමුදාවට කොටි පරාජය කිරීමට පදනමක් දා ගැනීමට කල්ගැනීමට ය. හමුදා ජයග්‍රහණ කරන බව පැහැදිලි වූ විට මම සර්ව පාක්ෂික කමිටුවේ කටයුතුවලින් බැහැර වීමි. උදය ගම්මන්පිළ මහතා ද එසේ කළ බව මගේ විශ්වාසය වෙයි. ඊනියා පශ්චාත් යුද්ධ තත්වය යටතේ කළ යුත්තේ සර්ව පාක්ෂික කමිටුව විසුරුවා හැර ඊනියා බලය බෙදීම අමතක කර උතුරු හා නැගෙනහිර පළාත්වල දැනට යම් ආකාරයක සංවර්ධනයක් ඇතිකර පශ්චාත් උගතුන් කෞතුකාගාරයක ගාල්කර මහජන ප්‍රදර්ශනය සඳහා තැබීම ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva